රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 08/2010(I)

මගේ අංකය : EST-6/05/TPR/5120
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2021.12.29

අමාත්‍යාංශ ලේකම්වරුන්
රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්

## රාජ්‍ය වියදම් කළමනාකරණය

ඉහත කරුණට අදාළව නිකුත් කර ඇති 2010.05.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 08/2010 කෙරෙහි ඔබේ අවධානය යොමු කරවමි. එකී චක්‍රලේඛයේ 02 ඡේදය, 2022 අයවැය යෝජනා අනුව පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.

02. ගරු අමාත්‍යවරුන්ගේ, ගරු රාජ්‍ය අමාත්‍යවරුන්ගේ සහ ගරු නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ පහත සඳහන් නිලධරයින්ට සපයා ඇති නිල වාහන වෙනුවෙන් මාසික ඉන්ධන දීමනාවක් පහත සඳහන් උපරිමයන්ට යටත්ව ගෙවනු ලැබේ.

| **හිමිකම් ලබන නිලධරයන්** | **පෙට්‍රල්/ ඩීසල් වාහන සඳහා මසකට අනුමත ඉන්ධන ලීටර් ප්‍රමාණය** |
|---|---|
| පෞද්ගලික ලේකම් | 235 |
| සම්බන්ධීකරණ ලේකම්/<br>මාධ්‍ය ලේකම්/<br>මහජන සම්බන්ධතා නිලධාරි | 213 |

03. මෙම සංශෝධන 2022.01.01 දින සිට ක්‍රියාත්මක වන අතර, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 08/2010 හි සඳහන් අනෙකුත් විධිවිධාන ඒ ආකාරයෙන් ම ක්‍රියාත්මක වේ.

04. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟතාව ඇතුව නිකුත් කරනු ලැබේ.

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය